# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය

## බෞද්ධ අධ්‍යයන පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව

**ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම් :**

- කවර හෝ විෂය ධාරාවකින් සාමාන්‍යවේදී හෝ විශේෂවේදී උපාධියක් ලබා තිබීම හෝ
- ඊට සමාන යැයි විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මඟින් පිළිගන්නා සුදුසුකම් සපුරා තිබීම.

**අධ්‍යයන මාධ්‍යය** : සිංහල

**කාලය** : වර්ෂ එක යි

**පාඨමාලා ගාස්තුව** : රු. 13,750/-

**අධ්‍යයන ක්ෂේත්‍රය :**

01 මුල් බුදුසමයේ මූලික ඉගැන්වීම්
02 බෞද්ධ සමාජ දර්ශනය
03 බෞද්ධ සංස්කෘතියේ නූතන ප්‍රවණතා
04 මහායාන බුදුසමය - මූලධර්ම
05 බුදුදහම හා සමාජ ගැටලු
06 විස්තාරිත රචනය

❖ මෙම පරීක්ෂණයට ලියාපදිංචි වන සිසුන් සඳහා සෙනසුරාදා දිනයන්හි දී පෙ.ව. 9.00 සිට ප.ව. 12.00 දක්වා අංක 214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 හි පිහිටි ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානයේ දී දේශන පවත්වනු ඇත.

❖ මෙම පරීක්ෂණයෙන් සමත්වීම ශාස්ත්‍රපති උපාධිය සඳහා ලියාපදිංචි වීමට සුදුසුකමක් වේ.

❖ අවසන් පරීක්ෂණය සෑම වර්ෂයක ම දෙසැම්බර් මාසයේ පවත්වනු ලැබේ.

# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය

## එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

**විෂය ධාරාව :**

බෞද්ධ දර්ශනය/බෞද්ධසංස්කෘතිය/සිංහල/පාලි/සංස්කෘත/පුරාවිද්‍යාව/සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය

**ලියාපදිංචිය සඳහා අවශ්‍ය සුදුසුකම් :**

- බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, පාලි, සිංහල, සංස්කෘත, පුරාවිද්‍යාව, සමය අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයයකින් ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය සමත් වීම

  හෝ

- එම විෂයයන් අතුරින් එකක් සහිත ව ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම

  හෝ

- ප්‍රාචීන පණ්ඩිත උපාධිය ලබා තිබීම

  හෝ

- විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මඟින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

| | | |
|---|---|---|
| **අධ්‍යයන මාධ්‍යය** | : | සිංහල/ඉංග්‍රීසි |
| **කාලය** | : | වර්ෂ එක යි |
| **පාඨමාලා ගාස්තුව** | : | රු 30,000/- |

**අධ්‍යයන ක්ෂේත්‍රය :**

❖ මෙම පාඨමාලාව බෞද්ධ අධ්‍යයනය හා භාෂා අධ්‍යයනය යනුවෙන් කොටස් දෙකකින් යුක්ත ය. එක් පාඨමාලාවක් අධ්‍යයන ඒකක පහකින් සමන්විත වේ. උපාධි පරීක්ෂණය සඳහා විභාග අපේක්ෂකයෙකු වශයෙන් තෝරා ගත යුත්තේ අනිවාර්ය ඒකකය ඇතුළු අධ්‍යයන ඒකක 05 ක් පමණි.

**බෞද්ධ අධ්‍යයන ඒකක :**

01. මුල් බුදුසමය - විවරණ ගැටලු **(අනිවාර්ය අධ්‍යයන ඒකකය)**
02. බුදුසමය හා සමකාලීන ආගම්
03. බෞද්ධ සමාජ දර්ශනයේ මූලධර්ම
04. බෝධිසත්ව දර්ශනය හා චරණය
05. බෞද්ධ සමාජ දර්ශනය හා නූතන ලෝකය **හෝ**
06. ශ්‍රී ලංකාවේ බෞද්ධ කලා හා වාස්තු විද්‍යාව

**භාෂා අධ්‍යයන ඒකක ඃ**

භාෂා අධ්‍යයනය යටතේ පාලි, සංස්කෘත හා සිංහල යන විෂයයන් සඳහා පහත සඳහන් පාඨමාලා පැවැත් වේ.

**පාලි**

01. මුල් බුදුසමය - විවරණ ගැටලු (අනිවාර්ය අධ්‍යයන ඒකකය)
02. නිර්දිෂ්ට ග්‍රන්ථ අධ්‍යයනය - I
03. නිර්දිෂ්ට ග්‍රන්ථ අධ්‍යයනය - II
04. නිකායාන්තර පිටක සාහිත්‍යය
05. පාලි කාව්‍යය හා සාහිත්‍ය විචාරය

**සංස්කෘත**

01. මුල් බුදුසමය - විවරණ ගැටලු (අනිවාර්ය අධ්‍යයන ඒකකය)
02. නිර්දිෂ්ට ග්‍රන්ථ අධ්‍යයනය - I (වෛදික හා ලෞකික)
03. නිර්දිෂ්ට ග්‍රන්ථ අධ්‍යයනය - II (දෘශ්‍ය කාව්‍ය හා ධර්ම ශාස්ත්‍ර - අර්ථ ශාස්ත්‍ර)
04. නිර්දිෂ්ට ග්‍රන්ථ අධ්‍යයනය - III (සංස්කෘත බෞද්ධ දාර්ශනික ග්‍රන්ථ)
05. භාරතීය සංස්කෘතිය හා ශිෂ්ටාචාරය

**සිංහල**

01. මුල් බුදුසමය - විවරණ ගැටලු (අනිවාර්ය අධ්‍යයන ඒකකය)
02. චිරන්තන සිංහල පද්‍ය සාහිත්‍යය
03. චිරන්තන සිංහල ගද්‍ය සාහිත්‍යය
04. සිංහල භාෂාවේ ඉතිහාසය සහ සිංහල ව්‍යාකරණ ශාස්ත්‍රය
05. වර්තමාන සිංහල සාහිත්‍යය සහ සාහිත්‍ය විචාරය

❖ මෙම පරීක්ෂණය සඳහා පැය තුනක ප්‍රශ්නපත්‍ර 05කට පෙනී සිටිය යුතු ය.

## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

### පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය

### ශාස්ත්‍රපති දෑවුරුදු පර්යේෂණ පශ්චාද් උපාධි පාඨමාලාව

**විෂය ධාරාව :**
බෞද්ධ දර්ශනය/බෞද්ධ සංස්කෘතිය/සිංහල/පාලි/සංස්කෘත/පුරාවිද්‍යාව/සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය

**ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම් :**

- බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, පාලි, සිංහල, සංස්කෘත, පුරාවිද්‍යාව, සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය යන විෂයයන්ගෙන් එක් විෂයයකින් ප්‍රථම පන්ති, දෙවන පෙළ ඉහළ පන්ති සාමර්ථ්‍යයක් සහිත ව ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් ලබා තිබීම.

  හෝ

- පිළිගත් විශ්වවිද්‍යාලයක එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධියක් සමත් වීම.

  හෝ

- ශාස්ත්‍රපති උපාධියට හා විශේෂ ශාස්ත්‍රවේදී උපාධියට සමාන යැයි මෙම විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මඟින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

**අධ්‍යයන මාධ්‍යය** : සිංහල/ඉංග්‍රීසි

**කාලය** : වර්ෂ දෙක යි

**පාඨමාලා ගාස්තුව** : රු. 45,500/-

**පාඨමාලාවේ සැලසුම :**

❖ මෙම පාඨමාලාවේ වසර දෙක සඳහා එකවර ලියාපදිංචි විය යුතු ය.

❖ පාඨමාලාව බෞද්ධ අධ්‍යයන හා භාෂා අධ්‍යයන යනුවෙන් කොටස් දෙකකින් යුක්ත ය. පළමු වර්ෂය අධ්‍යයන ඒකක 05කින් සමන්විත වේ. (මෙම පාඨමාලාවේ අධ්‍යයන ඒකක එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ අධ්‍යයන ඒකක ම වේ.)

❖ පළමු වසර අවසානයේ දී ප්‍රශ්න පත්‍ර පහක් සඳහා ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.

❖ ලිඛිත පරීක්ෂණයේ පශ්න පත්‍ර දෙකක් පමණක් අසමත් වී ඇත්නම් ඊළඟ වර්ෂයේ එම අසමත් ප්‍රශ්නපත්‍ර දෙකට පමණක් පෙනී සිට එක් පත්‍රයකට 50% බැගින් ලකුණු ලබා ගත යුතු ය.

❖ පළමු වසරේ මුල් මාස 06 ඇතුළත වචන 1500කට නොවැඩි විධිමත් පර්යේෂණ සැලැස්මක් ඉදිරිපත් කළ යුතු ය. එය විශ්වවිද්‍යාලයීය උසස් උපාධි කමිටුවට හා සනාතන සභාවට ඉදිරිපත් කර අනුමත කර ගත යුතු වේ.

❖ දෙවන වසරේ දී වචන 40,000 ට නොඅඩු පර්යේෂණ නිබන්ධයක් ඉදිරිපත් කළ යුතුය.

❖ ස්වාධීන පර්යේෂණ නිබන්ධය විශ්වවිද්‍යාලයට භාරදීමෙන් අනතුරු ව පරීක්ෂකවරුන් දෙදෙනෙකුගේ ඇගයීමෙන් පසුව සහ වාචික පරීක්ෂණය සමත් වීමෙන් පසුව උපාධිය පිරිනැමේ.

❖ ලියාපදිංචි කාලය දීර්ඝ කිරීම උපරි ම වසර පහකට (05) සීමා වේ.

# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය

## දර්ශනපති උපාධි පාඨමාලාව

**විෂය ධාරාව :**

බෞද්ධ දර්ශනය/බෞද්ධ සංස්කෘතිය/සිංහල/පාලි/සංස්කෘත/පුරාවිද්‍යාව/සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය

**ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම් :**

- ඉහත සඳහන් විෂයයන්ගෙන් එක් විෂයයකින් ප්‍රථම පන්ති හෝ දෙවන පෙළ ඉහළ පන්ති සාමර්ථ්‍යයක් සහිත ව විශේෂ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම.

  හෝ

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉහත සඳහන් කුමන හෝ විෂයයකට අදාළ ව ශාස්ත්‍රපති එක් අවුරුදු උපාධි පාඨමාලාවකින් සමත් වීම.

  හෝ

- මෙම සුදුසුකම්වලට සමාන යැයි මෙම විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මඟින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

| | | |
|---|---|---|
| **අධ්‍යයන මාධ්‍යය** | : | සිංහල/ඉංග්‍රීසි |
| **කාලය** | : | වර්ෂ දෙක යි |
| **පාඨමාලා ගාස්තුව** | : | රු. 42,000/- |

**පාඨමාලාවේ සැලසුම :**

- ❖ මෙම උපාධි පරීක්ෂණය සඳහා නියමිත කාලය ලියාපදිංචියේ සිට වර්ෂ දෙක යි.
- ❖ විධිමත් ව ඉදිරිපත් කළ අයදුම්පත විශ්වවිද්‍යාලයේ උසස් උපාධි කමිටුවේ නිර්දේශය පරිදි සනාතන සභාව පිළිගත් පසු පත් කරනු ලබන උපදේශක ආචාර්යවරයාගේ උපදෙස් මත මාස හයක් ඇතුළත ස්වකීය පර්යේෂණ සැලැස්ම ඉදිරිපත් කළ යුතු ය.
- ❖ විශ්වවිද්‍යාලය මගින් පත් කරනු ලබන අධ්‍යයන මණ්ඩලය ඉදිරියේ පර්යේෂණ සැලැස්මට අදාළ ව ප්‍රස්තුතීකරණයක් (Presentation) කළ යුතු ය.
- ❖ ලියාපදිංචි වී දෙවන වසරෙහි පළමු මාස 06 ඇතුළත ස්වකීය පර්යේෂණයට අදාළ ව සාහිත්‍ය විමර්ශනයක් ද සහිත ව අධ්‍යයන මණ්ඩලය ඉදිරියේ දී ප්‍රස්තුතීකරණයක් කළ යුතු ය.

- ❖ සෑම මාස හයකට ම වරක් උපදේශකවරයාගේ නිර්දේශය සහිත ව ප්‍රගති වාර්තා අංශාධිපති, පීඨාධිපති මගින් උසස් උපාධි කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

- ❖ වචන 60,000 කට නොඅඩු පර්යේෂණ නිබන්ධයක් ඉදිරිපත් කළ යුතු ය. එම කෘතිය අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ සමකාලීන දැනුම පුළුල් කරන්නක් මෙන් ම නවතාවකින් යුක්ත වූවක් ද විය යුතු ය.

- ❖ නියමිත කාලය ඉක්ම යෑමට පෙර නිබන්ධයේ පිටපත් තුනක් උපදේශකවරයාගේ නිර්දේශය සහිතව පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානයට ඉදිරිපත් කළ යුතු ය.

- ❖ නිබන්ධ පරීක්ෂකවරුන්ගේ යෝජනාව අනුව නිබන්ධය පිළිබඳ වාචික පරීක්ෂණය (Viva Examination) හා සම්මන්ත්‍රණය (Seminar) පවත්වනු ලැබේ.

- ❖ ලියාපදිංචි වී වසර දෙකක් ඉක්මවීමට පෙර පර්යේෂණ කාර්යය අවසන් කළ යුතු අතර යම් අපේක්ෂකයෙකුට නියමිත කාලය තුළ පර්යේෂණය අවසන් කිරීමට නොහැකි වුවහොත් උපදේශකවරයාගේ නිර්දේශය අනුව කාලය වසර පහක් දක්වා දීර්ඝ කර ගත හැකි ය. අපේක්ෂකයාගේ ඉල්ලීම උපදේශක ආචාර්යවරයා මගින් ඉදිරිපත් කළ යුතු ය. කාලය දීර්ඝ කිරීම වලංගු වන්නේ එක් වසරකට පමණි. එහෙයින් සෑම ලියාපදිංචි වසරක් අවසන් වීමට මාස 4කට පෙර මෙම ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය.

- ❖ ලබා දී ඇති ලියාපදිංචිය දීර්ඝ කිරීමේ කාලයට අමතර ව කිසිදු හේතුවක් මත කාලය දීර්ඝ නොකෙරේ.

## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

### පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය

## දර්ශන විශාරද උපාධි පාඨමාලාව

**විෂය ධාරාව :**

බෞද්ධ දර්ශනය/බෞද්ධ සංස්කෘතිය/සිංහල/පාලි/සංස්කෘත/පුරාවිද්‍යාව/සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය

**ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම් :**

- ඉහත සඳහන් කුමන හෝ විෂයයකින් පිළිගත් විශ්වවිද්‍යාලයක වසර දෙකකට නොඅඩු පර්යේෂණ පශ්චාද් උපාධියක් ලබා තිබීම.

  හෝ

- මේ හා සමාන යැයි මෙම විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මඟින් පිළිගනු ලබන පශ්චාද් උපාධි සුදුසුකමක් සපුරා තිබීම.

| | | |
|---|---|---|
| **අධ්‍යයන මාධ්‍යය** | : | සිංහල/ඉංග්‍රීසි |
| **කාලය** | : | වර්ෂ තුන යි |
| **පාඨමාලා ගාස්තුව** | : | රු. 57,000/- |

**පාඨමාලාවේ සැලසුම :**

❖ මෙම උපාධි පරීක්ෂණය සඳහා නියමිත කාලය ලියාපදිංචියේ සිට වර්ෂ තුන යි.

❖ විධිමත් ව ඉදිරිපත් කළ අයදුම්පත විශ්වවිද්‍යාලයේ උසස් උපාධි කමිටුවේ නිර්දේශය පරිදි සනාතන සභාව පිළිගත් පසු පත් කරනු ලබන උපදේශක ආචාර්යවරයාගේ උපදෙස් මත මාස හයක් ඇතුළත ස්වකීය පර්යේෂණ සැලැස්ම ඉදිරිපත් කළ යුතු ය.

❖ විශ්වවිද්‍යාලය මගින් පත් කරනු ලබන අධ්‍යයන මණ්ඩලය ඉදිරියේ පර්යේෂණ සැලැස්මට අදාළ ව ප්‍රස්තුතීකරණයක් (Presentation) කළ යුතු ය.

❖ ලියාපදිංචි වී දෙවන වසරෙහි පළමු මාස 06 ඇතුළත ස්වකීය පර්යේෂණයට අදාළ ව සාහිත්‍ය විමර්ශනයක් ද සහිත ව අධ්‍යයන මණ්ඩලය ඉදිරියේ දී ප්‍රස්තුතීකරණයක් කළ යුතු ය.

❖ සෑම මාස හයකට ම වරක් උපදේශකවරයාගේ නිර්දේශය සහිත ව ප්‍රගති වාර්තා අංශාධිපති, පීඨාධිපති මගින් උසස් උපාධි කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

❖ වචන 75,000 කට නොඅඩු පර්යේෂණ නිබන්ධයක් ඉදිරිපත් කළ යුතු ය. එම කෘතිය අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ සමකාලීන දැනුම පුළුල් කරන්නක් මෙන් ම නවතාවකින් යුක්ත වූවක් ද විය යුතු ය.

- නියමිත කාලය ඉක්ම යෑමට පෙර නිබන්ධයේ පිටපත් තුනක් උපදේශකවරයාගේ නිර්දේශය සහිතව පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානයට ඉදිරිපත් කළ යුතු ය.

- නිබන්ධ පරීක්ෂකවරුන්ගේ යෝජනාව අනුව නිබන්ධය පිළිබඳ වාචික පරීක්ෂණය (Viva Examination) හා සම්මන්ත්‍රණය (Seminar) පවත්වනු ලැබේ.

- ලියාපදිංචි වී වසර තුනක් ඉක්මවීමට පෙර පර්යේෂණ කාර්යය අවසන් කළ යුතු අතර යම් අපේක්ෂකයෙකුට නියමිත කාලය තුළ පර්යේෂණය අවසන් කිරීමට නොහැකි වුවහොත් උපදේශකවරයාගේ නිර්දේශය අනුව කාලය වසර තුනකින් දීර්ඝ කර ගත හැකි ය. අපේක්ෂකයාගේ ඉල්ලීම උපදේශක ආචාර්යවරයා මගින් ඉදිරිපත් කළ යුතු ය. කාලය දීර්ඝ කිරීම වලංගු වන්නේ එක් වසරකට පමණි. එහෙයින් සෑම ලියාපදිංචි වසරක් අවසන් වීමට මාස 4කට පෙර මෙම ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය.

- ලබා දී ඇති ලියාපදිංචිය දීර්ඝ කිරීමේ කාලයට අමතර ව කිසිදු හේතුවක් මත කාලය දීර්ඝ නොකෙරේ.